# ශ්‍රී ලංකාවේ පුරාණ ස්තූප සතු උරුම අගයන්: පාර්ශ්වකරුවන්ගේ අදහස්

චන්දිම බී. අඹන්වල[1]

## හැඳින්වීම

මෞර්ය සංස්කෘතික ආභාසය සහිතව ශ්‍රී ලාංකේය ජනයා විසින් නිමැවූ වාස්තු විද්‍යාංග පිළිබඳව විවිධ මූලාශ්‍රයන්ගෙන් අනාවරණය වන අතර ඒවා පිළිබඳ ද්‍රව්‍යාත්මක සාධකයන්ගෙන් දිවයින ආඪ්‍යවී ඇත. අවම වශයෙන් ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ සිට මේ දක්වාම මෙවැනි සාධක හමුවීම විශේෂත්වයකි. 'ආගමික' හා 'ආගමික නොවන' වාස්තු නිර්මාණ වශයෙන් පුළුල් වශයෙන් වර්ග කෙරෙන මෙම වාස්තුනිර්මාණ නැවත 'පූජනීය' හා 'පූජනීය නොවන' වශයෙන් වර්ග කළ හැකිවේ. මේවා අතුරින් සාතිශය වැඩි ප්‍රමාණයක් පුරාණ බෞද්ධාරාම හා ආබද්ධ අතර ඒවා පිළිබඳ ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක නැඹුරුවකින් යුතු අධ්‍යයන සිදුවී ඇත (Bandaranayake, 1974; Basnayake, 1986; පරණවිතාන, 1997; Wijesuriya, 1998; Silva, 2004). මෙම 'ආගමික පූජනීය' වාස්තු නිර්මිතයන් අතර 'බෞද්ධ ස්තූප' සඳහා විශේෂ අවධානයක් ලැබී ඇත. ආගමික, ඓතිහාසික, කලාත්මක, වාස්තුවිද්‍යාත්මක හා තාක්ෂණික ආදි විවිධ දෘෂ්ටීන් අනුව මේ පිළිබඳ පුළුල් අධ්‍යයන සිදුවී ඇතත් 'උරුම අධ්‍යයන/උරුම කළමනාකරණ' දෘෂ්ටියෙන් ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුවී ඇත්ද යන්න විමර්ෂණය කළයුතුව පවතී. මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලාංකේය ස්තූපය පිළිබඳ 'උරුම අගය/වටිනාකම්' (heritage value) සංකල්පය (විජේසූරිය, 2021:41-48) පදනම් කරගෙන ප්‍රජාමූලික දෘෂ්ටියෙන් (එම, 48-56) විමසා බැලෙනු ඇත. බටහිර සන්දර්භයේ දී පාර්ශ්වකරුවන් විසින් උරුමයන් සතු අගයන් කීපයක් හඳුනාගෙන ඇත. ඒවා ඓතිහාසික (historical) සෞන්දර්යාත්මක (aesthetic), ආර්ථික (economic), සමාජ (social) හා විද්‍යාත්මක (scientific) ආදි වශයෙන් පුළුල් වර්ග කීපයකට (Díaz-Andreu, 2017:2) ගොනුකර ඇත.

නූතන උරුම කථිකාවේ දී අතීත පරපුර විසින් නිර්මාණය කර වර්තමානිකයින් විසින් අත්පත්කොටගෙන ප්‍රයෝජන ලබා අනාගතය වෙත ප්‍රේෂණය කළයුතු ද්‍රව්‍යාත්මක හෝ ද්‍රව්‍යාත්මක නොවන දෑ  උරුමය වශයෙන් සැලකේ (එම, 2-18). තිරසාර උරුම කළමනාකරණයේ දී ප්‍රජා දායකත්ව සංකල්පය තුළ උරුම අගයන් හඳුනාගැනීම අත්‍යවශ්‍ය සාධකයකි. එවැනි තක්සේරුවකින් තොරව සිදුකරන උරුම කළමනාකරණ ක්‍රියාවලීන් අපේක්ෂිත අරමුණු සමර්ථනය කිරීමට අපහසු හා සාධනීය නොවූ ප්‍රවේෂ වශයෙන් හඳුනාගනී. උරුමය හා සම්බන්ධ 'පරිශීලන පරිමා' (reference scale) ගොඩනැඟීම හා ඒවා නිරතුරුව වර්ධනය කිරීම (building and continuing developing) ද සිදුවිය යුතුවේ. ක්ෂේත්‍රපාදක දත්ත අනුව ශ්‍රී ලාංකේය උරුමය සතු උරුම අගයන් හඳුනාගැනීම (Identification) තක්සේරු කිරීම (estimating) හා ප්‍රමුඛතාගත කිරීමක් (prioritising) මේ දක්වා නොසිදුවී පැවතීම තදබල හිස්තැනකි. එය තිරසාර උරුම කළමනාකරණයේ

1 පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. cbamba@rjt.ac.lk

දී ප්‍රමුඛ බාධාවකි, නොසලකා හැරීමකි. සංස්කෘතික උරුමස්ථාන සඳහා උරුම දර්ශක නිර්ණායක හඳුනාගැනීම, ගොඩනැඟීම හා නිරන්තර යාවත්කාලීන කිරීම නූතන උරුම කළමනාකරණයේ දී අත්‍යවශ්‍ය හා අනිවාර්ය වූවකි. එවැනි දර්ශක වඩාත් සාර්ථක උරුම කළමනාකරණ ප්‍රවේශයන් සඳහා ඉවහල් වන'තර ප්‍රජාව සුසංවාදී කරන චිරස්ථායි උරුම කළමනාකරණයක් සඳහා මඟපෙන්වීමක් ද ලබාදෙනු ඇත.

**අරමුණු**

ශ්‍රී ලංකා සංස්කෘතියේ පුරාණ ආගමික, සංස්කෘතික හා සමාජ පිළිබිඹුවක් වන ස්තූප පිළිබඳ ප්‍රජා කේන්ද්‍රීය නැඹුරුවකින් යුතු හා උරුම අගය සංකල්පය පදනම් කරගත් අධ්‍යයනයක් වන මෙහිදී අවධානය යොමුකරන පර්යේෂණ අරමුණු දෙකකි.

1. ශ්‍රී ලාංකේය ස්තූපය සතු අගයන් මොනවාද?

2 ශ්‍රී ලාංකේය ස්තූපය සතු අගයන්ගේ ප්‍රමුඛතාවන් කුමක් ද?

**ක්‍රමවේදය**

අධ්‍යයනය සඳහා 'ක්ෂේත්‍රපාදක දත්ත න්‍යාය' (Grounded Theory) යොදාගන්නා ලද අතර දත්ත රැස්කිරීම සඳහා 'අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා' (semi structured interviews) භාවිත කරන ලදී. සම්මුඛ සාකච්ඡාවේදී යොදාගත් ප්‍රශ්නය පහත දැක්වේ.

ශ්‍රී ලංකාවේ පුරාණ ස්තූප හා බැඳුණු 'උරුම අගයන්' මොනවාද? (ස්තූප පොදුවේ ගෙන හෝ විශේෂ ස්තූපයක් ගැන සිතා)

පාර්ශ්වකරුවනට පුරාණ ස්තූප පොදුවේ සිහිපත් කරගෙන හෝ විශේෂ ස්තූපයක් සිහිපත් කොටගෙන පිළිතුර ලබාදීමට අවස්ථාවක් ලබාදෙන ලදී. දත්ත දායකයින් තෝරාගැනීමේ දී, 1. ස්තූප උරුමය සම්බන්ධයෙන් පාර්ශ්වකාරිත්වයේ ප්‍රමාණය, 2. විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් හෝ සාමාන්‍ය පොදු දැනුමක් ග්‍රහණය කරගත් අයවලුන් වීම, 3. පොදු අධ්‍යාපන මට්ටමට වඩා ඉහළ මට්ටමක අයවළුන් වීම, 4. සාපේක්ෂව ඉහළ බුද්ධි සාඵල්‍යයක් ඇතැයි තහවුරු කර ඇති අයවළුන් වීම, 5. සමාජ සංවාදය සඳහා ඍජුව මැදිහත්වන හෝ ඒ සඳහා සාධනීය බලපෑමක් කළහැකි අයවළුන් වීම, 6. ස්ත්‍රී පුරුෂ භාවය, 7. වාර්ගිකත්වය, 8. ආගමිකත්වය යන නිර්ණායක පිළිබඳ අවධානය යොමුකරන ලදී. දත්ත දායකයින් 18 දෙනෙකු සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන ලදී. 'නිසඟයෙන් ගැබ්වූ' හා 'පාර්ශ්වකරුවන් විසින් ආරෝපණය කරනු ලබන' වශයෙන් උරුම අගයන් දෙයාකාර වුවත් දෙවැනිව දැක්වූ උරුම අගයන් පමණක් හඳුනාගැනීමට කටයුතු කරන ලදී.

**ප්‍රතිඵල**

සම්මුඛ සාකච්ඡා මගින් ස්තූප සතු යැයි පාර්ශ්වකරුවන් පෙන්වා දෙන ලද, ඊට ආරෝපණය කරනු ලබන උරුම අගයන් 40ක් හඳුනාගැනිණි. එම අගයන් සිංහල හෝඩියේ ආකාරාදි අනුපිළිවෙල අනුව දැක්වූ විට 1. අධ්‍යාපනික (Educational) අගය, 2. අනන්‍යතාව (Identity) 3. අනාගතවාදි (Futuristic) අගය, 4. අවස්ථානුරූප

(Situational) අගය, 5. ආගමික (religious) 6. ආධ්‍යාත්මික අගය (spiritual) 7. ආර්ථික අගය (economical) 8. උපයෝගිතා (utility) අගය 9. එකමුතුකම (unity) 10. ඓතිහාසික (historical) අගය 11. ඓන්ද්‍රීය (organ) අගය 12. ඓශ්චර්ය (miracle) 13. කලාත්මක (Art) අගය 14. කළමනාකරණ (management) අගය 15. කෘතවේදිත්ව (Gratitude) අගය 16. ගුප්තමය (Mystic) අගය 17. ජීවමය බව (live) 18. තාක්ෂණික (technological) අගය 19. දේශපාලන (political) අගය 20. පාරිසරික/පිහිටීම (environmental/ Locatinal) 21. පුරාවිද්‍යා (Archaeology) අගය 22. පූජනීය (Sacred) අගය 23. පෞඪත්වය (Pride) 24. බුද්ධ සංකේතමය (symbol for the lord buddha) 25. භාවමය (Emotional) 26. භාව විශෝධන (Mood correction) අගය 27. භාවිත (use) අගය 28. මානවවංස (ethnological) අගය 29. මානසික/මනෝවිද්‍යා (Mental/ Psychology) 30. වාස්තුවිද්‍යාත්මක අගය (architectural) 31. විද්‍යාත්මක (scientific) අගය 32. විශ්මිතබව (Amazing) 33. විශ්වීය (Universal) අගය 34. ස්වාධිපත්‍යමය (autonomy) අගය 35. සංකේත අගය (symbolic) 36. සංචාරක (tourism) අගය 37. සංස්කෘතික 38. සන්නිවේදන (communicational) අගය 39. සමාජ දර්ශක (social index) අගය හා 40. සමාජමය/සමාජවිද්‍යා (social/sociological) අගය වශයෙන් දැක්විය හැකිවේ.

එම එක් එක් අගයන්/වටිනාකම් තුළින් ප්‍රේරිත ගුණාත්මය පිළිබඳ සම්මුඛ සාකච්ඡා තුළින් අනාවරණය කරගත් අදහස් පහත දක්වා ඇත. 'අධ්‍යාපනික' අගය යනු, ස්තූප වනාහි ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා යොදාගත හැක්කක් වීමය. ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිබිඹු කිරීම 'අනන්‍යතා' යන්නෙන් අදහස් කෙරේ. අනාගතය පිළිබඳ මාර්ගෝපදේශයක් ලබාදීම 'අනාගතවාදී' යන්නෙන් ද, අවස්ථාව අනුව ඊට වැදගත්කම් හිමිවීම 'අවස්ථානුරූප' අගය යන්නෙන් ද බෞද්ධාගමිකයින්ට වැදගත් ස්ථානයක් වීම 'ආගමික' යන්නෙන් ද ආධ්‍යාත්මික සුවයක් ලබාදෙන ස්ථානයක් වීම 'ආධ්‍යාත්මික' වශයෙන් ද අදහස් කෙරේ. ස්තූප වටා ආර්ථික ක්‍රියාවලියක් ගොඩනැඟී තිබීම 'ආර්ථික' අගය වශයෙන් ද උපයෝගීතාවක් පැවතීම 'උපයෝගිතා' අගය වශයෙන් ද සැදැහැවතුන් එක්රැස්වී පුදපූජා පවත්වන ස්ථානයක් වීම නිසා 'එකමුතුකම' ද ඉතිහාසය පිළිබඳ සාක්ෂ්‍ය සපයන බැවින් 'ඓතිහාසික' වටිනාකමක් ද ඊට හිමිවේ. ජනජීවිත හා බද්ධවූ ස්ථානයක් බැවින් 'ඓන්ද්‍රීය' අගය පවත්නා අතර නරඹන්නා තුළ විශ්මයක් ඇති කරන බැවින් 'ඓශ්චර්ය' අගය ද වැදගත් කලා ඉතිහාස මූලාශ්‍රයක් බැවින් 'කලාත්මක' අගයක් ද ඊට හිමිවේ. ස්තූපයක් නිර්මාණය කිරීම මෙන්ම එවා ආගමික වශයෙන් පවත්වාගැනීම වනාහි බොහෝ භාරදූර කළමනාකරණය හැකියාවන් පෙන්නුම් කරන ස්ථානයක් බැවින් ඊට 'කළමනාකරණ' අගයක් හිමිවේ. 'කෘතවේදිත්ව' යනු, උතුම් මිනිසෙකු හෝ මිනිසුන් වෙනුවෙන් සිදුකරන කෘතවේදිත්වය පිළිබිඹු කරයි. විසඳාගත නොහැකි සැඟවුණු හැඟීමක් ඇති බැවින් ඊට 'ගුප්තමය' අගයක් ද ඇත. බෞද්ධයින්ගේ එදිනෙදා ජීවිතය හා බැඳුණු, ගනුදෙණු කළහැකි දෙයක් බැවින් ඊට 'ජීවමය' අගයක් ද නිර්මාණ තාක්ෂණික කරුණු අනාවරණය කරගත හැකි තවත් විටෙක අප නොදන්නා තාක්ෂණික භාවිතාවක් ඇති නිර්මාණයක් බැවින් 'තාක්ෂණික' අගයක් ද ස්තූප සතුවේ. පෙර පාලකයින් තම දේශපාලන ආධිපත්‍ය පෙන්නුම් කිරීම සඳහා ස්තූප නිර්මාණය කර ඇත. වර්තමානයේ ද එසේමය. එබැවින් ඉට 'දේශපාලන' අගයක් හිමිවී ඇත. පාරිසරික වශයෙන් වැදගත් හා කැපීපෙනෙන තැනක පිහිටා ඇත. එහි පිහිටීම මගින් විවිධ කරුණු අනාවරණය කරගත හැකි බැවින් 'පාරිසරික/පිහිටීම' පිළිබඳ අගය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් බැවින්

'පුරාවිද්‍යා' අගයක් මෙන්ම වන්දනා කිරීමට පුළුවන් බැවින් 'පූජනීය' වටිනාකමක් හිමිවී ඇත. අතීත මිනිසුන් පිළිබඳ ආඩම්බරයක් ඇතිකරගත හැකි බැවින් 'ප්‍රෞඩත්වය' ද පවතී. ජීවමාන බුදුන් වහන්සේ සංකේත කරන නිර්මාණයක් බැවින් 'බුද්ධ සංකේතමය' අගය ද, ස්තූපයක් අසල දී භාවමය වශයෙන් සංවේදි බවක් ඇතිවන බැවින් 'භාවමය' අගය ද විසඳාගැනීමට අපහසු ප්‍රශ්නයක් හෝ ගැටලුවක් ඇතිවූ අවස්ථාවක දී ඒ අසලට ගොස් දුක, කනගාටුව, තනිකම සමනය කරගත හැකි නිසා 'භාව විශෝධන' අගය ද ස්තූපයන් සතුව පවතී. 'භාවිත' අගය යනු, විවිධ අදහස් වෙනුවෙන් විශේෂයෙන්ම ආගමික දේ වෙනුවෙන් භාවිත කළහැකි ස්ථානයක් වීමයි. මානවවංශ වශයෙන් වැදගත් හා අධ්‍යයනය කළ හැකි දේ සිදුවන ස්ථානයක් බැවින් 'මානවවංස' විද්‍යාත්මක වටිනාකමක් ඇත. සිතේ සංසුන්බවක් ඇති කරන ස්ථානයක් නිසා 'මානසික/මනෝවිද්‍යා' අගය ඇත. පුරාණ වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි මූලාශ්‍රයක් බැවින් 'වාස්තුවිද්‍යාත්මක' අගය ද විද්‍යාත්මක පදනමක් මත නිර්මාණය කර ඇති විද්‍යාත්මකව අධ්‍යයන සිදුකළ හැකි ස්ථානයක් බැවින් 'විද්‍යාත්මක' අගය ද ඇත. විශාල ස්තූපයක් අසළට ගිය විට එය නිර්මාණය කළේ කොහොමද යන විශ්මය ඇතිවේ. එවැන්නක් අසල දී අප කෙතරම් කුඩා අය ද යන්න හැඟෙන බැවින් ඒ තුළ 'විශ්මිත' බවක් ද ගෝලීය වශයෙන් සැලකීමේ දී මනුෂ්‍ය ප්‍රජාවට වැදගත් උරුමයක් බැවින් 'විශ්වීය' අගය ද දේශපාලන ආධිපත්‍ය පිළිබඳ හැඟිමක් ස්තූප මඟින් ඇතිකරන බැවින් 'ස්වාධිපත්‍යමය' අගය ද බෞද්ධාගමික සංකේතයක් බැවින් 'සංකේත' අගය ද පවතී. 'සංචාරක' අගය යනු, විවිධ අරමුණු සහිත සංචාරකයින් පැමිණෙන ඔවුන් ආකර්ශනය කරන ස්ථානයකි. සංස්කෘතික කටයුතු සිදුවන ඒ හා සම්බන්ධ ස්ථානයක් බැවින් 'සංස්කෘතික' අගය ද ආගමික, සංස්කෘතික හා සමාජ අදහස් සන්නිවේදනය කරන නිර්මාණයක් බැවින් 'සන්නිවේදන' අගය ද පවතී. සමාජයේ වර්ධනය පිළිබඳ පිළිබිඹුවක් බැවින් 'සමාජ දර්ශක' වටිනාකමක් හිමිය. සමාජ අනුකලනය කරන මිනිසුන් සමාජයක් වශයෙන් සම්බන්ධ කරන නිසා 'සමාජමය/සමාජවිද්‍යා' වටිනාකමක් හිමිව පවතී.

**සාකච්ඡාව/නිගමන**

පාර්ශ්වකරුවන් විසින් නම් කරන ලද උරුම අගයන් පාර්ශ්වකරුවන් ප්‍රමාණය මත ප්‍රතිශත වශයෙන් සලකා බැලිය හැකිවේ (ප්‍රතිශත දැක්වීමේ දී ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයා ඇත). ඒ අනුව, පාර්ශ්වකරුවන්ගෙන් 76-100% ප්‍රමාණයක් 5. ආගමික, 6. ආධ්‍යාත්මික, 7. ආර්ථික, 10. ඓතිහාසික, 13. කලාත්මක, 18.තාක්ෂණික, 21. පුරාවිද්‍යා හා 40. සමාජමය/සමාජවිද්‍යා යන අගයන් ස්තූපයන් සතු බව පිළිගන්නා අතර 51-75% ප්‍රමාණයක් 30. වාස්තුවිද්‍යාත්මක හා 36. සංචාරක අගයන් ද 26-50% ප්‍රමාණයක් 19. දේශපාලන, 22. පූජනීය, 29. මානසික/මනෝවිද්‍යා, 35. සංකේත හා 37. සංස්කෘතික යන අගයන් ස්තූප සතු බව පෙන්වා දෙන ලදී. පාර්ශ්වකරුවන්ගෙන් 1-25% ප්‍රමාණයක් විසින් 1. අධ්‍යාපනික, 2. අනන්‍යතා, 3.අනාගතවාදි, 4.අවස්ථානුරූප අගය, 8. උපයෝගිතා, 9. එකමුතුකම, 11. ඓන්ද්‍රීය, 12. ඓශ්චර්ය, 14. කළමනාකරණ, 15. කෘතවේදිත්ව, 16.ගුප්තමය, 17.ජීවමය, 20. පාරිසරික/පිහිටීම, 23. පෞඩත්වය, 24. බුද්ධ සංකේතමය, 25. භාවමය, 26. භාව විශෝධන, 27. භාවිත, 28. මානවවංස, 31. විද්‍යාත්මක, 32. විශ්මිත, 33. විශ්වීය, 34. ස්වාධිපත්‍යමය, 38. සන්නිවේදන හා 39. සමාජ දර්ශක යන අගයන් ස්තූපයන් තුළින් දැකගත හැකි බවත් සඳහන් කරන ලදී.

උරුමය වනාහි පාර්ශ්වකරුන්ගේ හැඟීම් සමඟ අත්‍යන්තයෙන්ම බද්ධවූ සංකල්පයකි. මානව ගතිකතාව සමඟ සියුම් පරාසයන් පවා ආවරණය කරමින් උරුම අගය සංකල්පය ප්‍රවර්ධනය කිරීම වඩාත් සංවේදී උරුම අර්ථ දැක්වීම් හා උරුම කළමනාකරණ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ඉවහල් වේ. ක්ෂේත්‍ර පාදක දත්ත පදනම් කරගෙන, ප්‍රමුඛ ශ්‍රී ලාංකේය උරුමයක් වන ස්තූප සම්බන්ධ උරුම අගයන් ප්‍රමාණය සංඛ්‍යාත්මකව 40ක් දක්වා වර්ධනය කළහැකිවිය. ජීවමාන ස්පර්ශනීය සංස්කෘතික උරුමය වනාහි අස්පර්ශනීය ගුණයන් ද කැටිකරගත් සංස්කෘතික ප්‍රකාශනයකි. එබැවින් ශ්‍රී ලාංකේය පුරාණ ස්තූප යනු, හුදු ද්‍රව්‍යාත්මක ප්‍රකාශනයක් පමණක් නොව අර්ථ රැසක් සහිත අස්පර්ශනීය වටිනාකම් කැටිකොටගත් සංකල්පයක් වශයෙන් අර්ථ දැක්වීමට යෝග්‍ය ප්‍රවේශයන් මෙම උරුම අගය හඳුනාගැනීම තුළින් සාධාරණීකරණය කිරීමට අවැසි අනුබලය සැපයේ.

**ඉදිරි පර්යේෂණ අවශ්‍යතා**

ස්තූප වනාහි ඓතිහාසික අගයක් සහිත ද්‍රව්‍යාත්මක නිමැවුමක් පමණක් නොව එහි පාර්ශ්වකරුවන් සමඟ අත්‍යන්තයෙන් බැඳුණු අනන්‍යතා මෙන්ම ගතිකතාවන් ද හිමිකරගත්, ජීවමාන ගුණයෙන් අනූන, ද්‍රව්‍යාත්මක පිළිබිඹුවකි. ඊට හිමි හා ආවේනික ජීවි ගුණයන් ආගමික පරමාර්ථයන් සමඟ බැඳී ඇතුවාක් මෙන්ම නිරන්තර යාවත්කාලීනවීමේ ගුණය ද විදහා දක්වයි. එබැවින් වඩාත් පුළුල් නියැදි යොදාගෙන උරුම අගයන් හඳුනාගැනීමත්, යාවත්කාලීන කිරීමත් අත්‍යාවශ්‍යය. පුළුල් හා සාර්ථක උරුම කළමනාකරණ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී හා සංරක්ෂණ මැදිහත්වීමේදී මෙම හඳුනාගැනීම් හා යාවත්කාලීන කළ තක්සේරු පාර්ශ්වකරුවන්ගේ ආතතිය අවම කරන උරුම කළමනාකරණ ප්‍රවේශයන් ගැනීම සඳහා ඉවහල් වනු ඇත. උරුමය සම්බන්ධ ව්‍යුහගත හා අධිකාරිලත් ආයතන මැදිහත්වීම සහිතව ශ්‍රී ලාංකේය ජීවමාන උරුමය හා බද්ධවූ උරුම අගයන් හඳුනාගැනීම හා ප්‍රමුඛතාගත කිරීම සඳහා 'ප්‍රජා දායකත්වය පද්ධතියක්' ගොඩනැඟීම සඳහා විධිමත් හා පාරදෘෂ්‍ය යාන්ත්‍රණයක් ගොඩනැඟීම වර්තමාන උරුම කළමනාකරුවන් වෙත පැවරී ඇති වගකීමකි.

**ස්තුතිය**

මෙම අධ්‍යයනය සඳහා මඟ පෙන්වූ ආචාර්ය ගාමිණී විජේසූරිය, මහාචාර්ය කේ.වී. අරුණ ශාන්ත විද්වතුනටත් දත්ත දායකයනටත් විවිධාකාරයෙන් සහයෝගය ලබාදුන් ඉංජිනේරු අනුරාධ පියදාස මහතාටත් ස්තුතිය පිරිනැමේ.

**ප්‍රමුඛ පද** - ස්තූප, උරුම කළමනාකරණය, උරුම අගය, ජීවමාන උරුමය, පාර්ශ්වකරුවන්

**ආශ්‍රිත ග්‍රන්ථ**

පරණවිතාන, සෙනරත්, (1997). *ලංකාවේ ස්තූපය.* ඇල්. ප්‍රේමතිලක (පරි.). බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. (පළමු වන මුද්‍රණය 1963).

විජේසූරිය, ගාමිණී (2021). *සංස්කෘතික උරුමයන් සංරක්ෂණය හා කළමනාකරණය: නව ප්‍රවනතා.* Colombo: ICOMOS Sri Lanka.

Bandaranayake, S. (1974). *Sinhalese Monastic Architecture*. Leiden E.J. Brill.

Basnayake, H.T. (1986). *Sri Lankan Monastic Architecture*. Delhi: Sri Satguru Publications.

Díaz-Andreu, M. (2017) ‘Introduction’, *Special Issue, Heritage Values and the Public*. Edited by Margarita Díaz-Andreu. Journal of Community Archaeology and Heritage 4(1): page 2–6.

Silva, R. (2004). *Thupa, Thupaghara and Thupa Pasada*. Colombo: Department of Archaeology.

Wijesuriya, G. (1998). *Buddhist meditation monasteries of ancient Sri Lanka*. Colombo: Department of Archaeology.